## මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013
## (04) සංස්කෘත

05. වසර

පැ තුනයි

**I** කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** ද, **II** කොටසින් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස.

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) इ , ऊ , औ , कृ යන අක්ෂරවල මාත්‍රා ගණන පිළිවෙළින් ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) क अ छ ग झ द ण थ ट ख त म ल च फ යන අකුරු අතරින් අඝෝෂ අකුරු වෙන් කොට දක්වන්න. *(ලකුණු 04 යි)*

(iii) अ + इ හා अ + ओ යන අකුරු එකතු වී සෑදෙන සන්ධ්‍යක්ෂර දෙක මොනවා ද? *(ලකුණු 04 යි)*

(iv) පඤ්චමී විභක්ති ප්‍රයෝග දෙකක් අර්ථවත් කරන වාක්‍ය දෙකක් තනන්න. *(ලකුණු 04 යි)*

(v) පූර්වක්‍රියා යනු කුමක්දැයි දක්වා උදාහරණ දෙකක් දෙන්න. *(ලකුණු 04 යි)*

(vi) मालायाम् , दिशो යන පද අයත් විභක්ති හා වචන ලියන්න. *(ලකුණු 04 යි)*

(vii) රාමායණයෙහි රචකයා කවු ද? *(ලකුණු 04 යි)*

(viii) හිතෝපදේශයේ කොටස් හතර නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ix) ස්වරයක් පර ව ඇතිවිට පූර්ව ‘‘ උ ’’ වෙනුවට ‘‘ ව් ’’ ආදේශ කරන සූත්‍රය කුමක් ද? *(ලකුණු 04 යි)*

(x) श्रमणस्य पुत्रः යන විග්‍රහයෙන් සෑදෙන සමාස රූපය හා තද්ධිත රූපය ලියන්න. *(ලකුණු 04 යි)*

### II කොටස.

**2.** (i) පහත දැක්වෙන වාක්‍ය සිංහලයට නගන්න.

१. स्वगृहे पूज्यते मूर्खः ।

२. पिता नगरं गत्वा मोदकानि आनयिष्यति ।

३. इह वर्षे साधारणराज्यनायकाः आगच्छन्ति ।

*(ලකුණු 06 යි)*

(ii) පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නගා දේව නාගරී අකුරින් ලියන්න.

1. ඇමතිවරු ගමින් ගමට ද නගරයෙන් නගරයට ද යති.

2. ඥානේශ්වර හිමි ‘‘ යති දූතම් ’’ නමැති පොත රචනා කළේ ය.

3. නුඹ යන තැනට මම ද යමි.

*(ලකුණු 09 යි)*

3. (i) √ताड् හෝ √वन्द् ධාතුව ලෘට් ලකාර පරස්මෛ පදයෙහි සම්පූර්ණයෙන් වරනඟන්න.

(ලකුණු 05 යි)

(ii) පහත පද සැලකිල්ලට ගෙන නිර්දේශ කර ඇති පරිදි වගුව පුරවන්න.

| පදය | ශබ්දය | ලිංගය | විභක්තිය | වචනය |
|---|---|---|---|---|
| अलिना | | | | |
| पात्रे | | | | |
| मात्रे | | | | |
| गंगायै | | | | |
| मरुताम् | | | | |

(ලකුණු 10 යි)

4. පහත පද කුමන වර්ගයකට අයත්දැයි තෝරා තේමාවට අදාළ කොටුවේ (√) හරි ලකුණ යොදන්න.

(ලකුණු 1×15 =15 යි)

The National e-learning Portal for The General Education

| පදය | සන්ධි | සමාස | තද්ධිත | කෘදන්ත |
|---|---|---|---|---|
| भीमानुजौ | | | | |
| वैदिक | | | | |
| किन्तूदेति | | | | |
| धनैरपि | | | | |
| राज्यसेवकः | | | | |
| कुसलता | | | | |
| पतित | | | | |
| उपवनम् | | | | |
| वाचालः | | | | |
| नत्वा | | | | |
| वाग्यथा | | | | |
| अष्टशीलानि | | | | |
| गच्छमानः | | | | |
| इत्याह | | | | |
| कृष्णसर्पः | | | | |

**5.** පහත පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

अस्ति गौतमस्य महर्षेस्तपोवने महातपा नाम मुनिः। तत्र तेन मुनिना काकेन नीयमानो मूषिकशाबको दृष्टः। ततः स्वभावदयात्मना तेन मुनिना नीवारकणैः संवर्धितः। ततो बिडालः तं मूषिकं खादितुमुपधावति। तमवलोक्य मूषिकस्तस्य मुनेः क्रोडे प्रविवेश। ततो मुनिनोक्तम् " मूषिक त्वं मार्जारो भव "। ततः स बिडालः कुक्कुरं दृष्ट्वा पलायते। ततो मुनिनोक्तम् " कुक्कुराद् बिभेषि त्वमेव कुक्कुरो भव "। स च कुक्कुरो व्याघ्राद् बिभेति। ततस्तेन मुनिना कुक्कुरो व्याघ्रः कृतः। अथ तं व्याघ्रं मुनिर्मूषिकोयमिति पश्यति। अथ तं मुनिं व्याघ्रं च दृष्ट्वा सर्वे वदन्ति , अनेन मुनिना मूषिको व्याघ्रतां नीतः। एतच्छ्रुत्वा स व्याघ्रोचिन्तयत् । यावदनेन मुनिना स्थीयते तावदिदं मे स्वरूपाख्यानम् अकीर्तिकरं न पलायिष्यते इत्यालोच्य मूषिकस्तं मुनिं हन्तुं गतः। ततो मुनिना तज्ज्ञात्वा " पुनर्मूषिको भव " इत्युक्त्वा मूषिक एव कृतः॥

i. මහාතප නම් මුනිවරයා කොහේ සිටියි ද? *(ලකුණු 01 යි)*

ii. කපුටෙකු විසින් ගෙන යනු ලබන මීයාව හදා වඩා ගත්තේ කෙසේද? *(ලකුණු 02 යි)*

iii. මුනිවරයාගේ ඇකයට පිවිසි මීයාට කවුරු කුමක් කීවේ ද? *(ලකුණු 03 යි)*

iv. ව්‍යාඝ්‍රයාට බිය වූ බල්ලාට මුනිවරයා කළේ කුමක් ද? *(ලකුණු 01 යි)*

v. කවුරුන්ව දැක සියල්ලෝ කුමක් කීවෝ ද? *(ලකුණු 03 යි)*

vi. මීයා වරින්වර කෙබඳු ස්වභාවයන්ට පත් වී ද? *(ලකුණු 03 යි)*

vii. මුනිවරයා ව්‍යාඝ්‍රත්වයට පත් මීයාට කළේ කුමක් ද? *(ලකුණු 02 යි)*

**6.** පහත දැක්වෙන පද්‍ය සිංහලට නගන්න.

तन्मा कृथाः शोकमिमं प्रति त्वं तत्सौम्य शोच्ये हि मनुष्यलोके ।
मोहेन वा कामसुखैर्मदाद्वा यो नैष्ठिकं श्रोष्यति नास्य धर्मं ॥

भ्रष्टस्य तस्माच्च गुणादतो मे ध्यानानि लब्ध्वाप्यकृतार्थतैव ।
धर्मस्य तस्याश्रवणादहं हि मन्ये विपत्तिं त्रिदिवेऽपि वासं ॥

इति श्रुतार्थः ससुहृत्सदारस्त्यक्त्वा विषादं मुमुदे नरेंद्रः ।
एवंविधोऽयं तनयो ममेति मेने स हि स्वामपि सारवत्ताम् ॥

--- बुद्धचरिते ।

*(ලකුණු 5 ×3 =15 යි)*

**7.** පහත සඳහන් පාඨය සිංහලට නගන්න.

इति विप्राय लक्षं दत्वा किं ते नाम इत्याह । विप्रः स्वनाम भूमौ लिखति " गोविन्दः " इति । राजा वाचयित्वा " विप्र , प्रत्यहं राजभवनमागन्तव्यम्। न ते कश्चिन्निषेधः । विद्वांसः कवयश्च कौतुकात्सभामानेतव्याः। कोऽपि विद्वान्न खलु दुःखभागस्तु एनमधिकारं पालय " इत्याह।

एवं गच्छत्सु कतिपयदिवसेषु राजा विद्वत्प्रियो दानवित्तेश्वर इति प्रथामगात्। ततो राजानं दिदृक्षवः कवयो नानादिग्भ्यः समागताः। एवं वित्तादिव्ययं कुर्वाणं राजानं प्रति कदाचिन्मुख्यामात्येनेत्थमभ्यधायि – " देव , राजानः कोशबला एव विजयिनः। नान्ये॥ "

--- भोजप्रबन्धे ।

*(ලකුණු 15 යි)*

**8.** (i) කතෘ, කාලය, ප්‍රමාණය, අන්තර්ගතය, අරමුණ යන කරුණු ඔස්සේ භෝජ ප්‍රබන්ධය පිළිබඳ සටහනක් ලියන්න.

**නැතහොත්**

(ii) ‘‘ අශ්වඝෝෂ හිමිගේ කවි කුසලතාව බුද්ධචරිත මහා කාව්‍යයෙන් පිළිබිඹු වේ ” විමසන්න.

*(ලකුණු 15 යි)*

* * *